# ශ්‍රී ලංකා වරාය අධිකාරිය
## දැන්වීමයි

පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** තනතුර : **<u>ඉංජිනේරු (සිවිල්) - MLM 1</u>**
**<u>ඉංජිනේරු (විදුලි හා විද්‍යුත්) - MLM 1</u>**
**<u>ඉංජිනේරු (නාවික /යාන්ත්‍රික) - MLM 1</u>**

**අ)** **යෝග්‍යතාවය**
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාවේදී (සිවිල්, විදුලි හා විද්‍යුත්, නාවික /යාන්ත්‍රික) උපාධියක් හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙන් ලබාගත් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම.

**ආ)** **වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 4 : 1 (MLM 1) |
| ආරම්භක වැටුප | : | රු. 92,650/= |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,725/= |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 185,000/= ක් පමණ වේ

**සටහන :** ඉංජිනේරු තනතුර සඳහා ආශ්‍රිත ඉංජිනේරු කාණ්ඩය (A Eng.) හෝ ඊට ඉහළ කාණ්ඩයක් යටතේ ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ (ECSL) හි ලියාපදිංචිය අනිවාර්යය වේ.

**වයස් සීමාව : වයස අවුරුදු 45 ට අඩු විය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි)**

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම අංශයක / කොට්ඨාශයක සහ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් හා පරිපාලන), මානව සම්පත් හා පරිපාලන කොට්ඨාශය , ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොළඹ 13.** යන ලිපිනයට ලැබෙන සේ 2026-10-12 වන දිනට පෙර **<u>ලියාපදිංචි තැපෑලෙන්</u>** එවිය යුතුයි. **අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.**

**<u>අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED